# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2015

2020 පෙබරවාරි - අප්‍රේල්

මානවශාස්ත්‍ර පීඨය

භාෂා පරිවර්තන ක්‍රම

සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතාව TRMD E 1015

පළමු කොටසින් පළමුවන ප්‍රශ්නය සහ අවම වශයෙන් තවත් එක් ප්‍රශ්නයක් ද දෙවන කොටසින් අවම වශයෙන් කැමති ප්‍රශ්න දෙකක් ද ඇතුළත් වන සේ ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 8 යි. කාලය : පැය 03 යි.

---

## 1 කොටස - Part I

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 350 - 400 පමණ වන සේ රචනයක් ලියන්න.

   i.) භාෂා පරිවර්තනය සහ සන්නිවේදනය.

   ii.) යටිතල පහසුකම් දියුණු කිරීම සමග ඇතිවන පරිසර හානිය

   iii.) විශ්වවිද්‍යාලය, සමාජයේ හැඩරුව පිළිබිඹු කරන කැඩපතකි.

   iV.) සන්නිවේදන තාක්ෂණ මෙවලම් සහ භාෂා පරිණාමය.

(ලකුණු 20)

02. පහත සඳහන් ඡේදය කියවා එහි ඇති වචන ප්‍රමාණයෙන් තුනෙන් එකක් වන සේ සාරාංශ කොට ලියා , ඊට සුදුසු මාතෘකාවක් ද යොදන්න. ඔබ විසින් යොදන ලද වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

(ලකුණු 20)

නරක වෙනුවට හොඳ ම දේ ළඟා වෙතැ'යි විශ්වාසය පළ කරන්න. මුවින් පමණක් නො ව, මුළු හදවතින් ම යහපතක් සිදු වනු ඇතැ'යි බලාපොරොත්තු වන්න. ඔබ බලාපොරොත්තු වන යහපත - හොඳ - විශිෂ්ටත්වය - ජයග්‍රහණ අසීමිත ලෙසත්, ළයාන්විත ලෙසත් ඔබ කරා ළඟා වෙනු ඇත.

ලැබුණොත් හොඳයි, ලැබෙයි ද මන්දා, ඕවා කොහේ ද අපිට, අපි පොඩි මිනිස්සු, අපට කොයින් ද සල්ලි, ඒ ගොල්ලොත් එක්ක හැපෙන්න අපට පුළුවන් ද?, අම්මෝ ඒකෙ ගණන්, ජීවිතයම එකතු කළත් ඒක ගන්න ලැබෙන්නේ නෑ, රුපියල් අස්සේ මොකට ද ශත ගහන්නෙ, අපට පුළුවන් ද ඉහළ අතු අල්ලන්න. යනාදි වශයෙන් අප ඇසුරු කරන සමාජයේ උදේ සිට රෑ නින්දට යන තුරු ම පුද්ගලයන්ගේ මුවින් පිටවන ඍණාත්මක අදහස් බලන්න. මේ පොත කියවූ පසු ව වත් අනුන් සතුටු කිරීමට හෝ මෙවැනි ඍණාත්මක අසුබවාදී ප්‍රකාශ නොකිරීමට ඉටා ගන්න.

ඔබ බලාපොරොත්තු වන ජයග්‍රහණය, අනාගතයේ පත් විය යුතු තැන, අත්පත් කරගත යුතු ධනය, හෘදයංගම ව පතන්න. අතිශය හෘදයංගම ව, හදවතට එකඟ ව භක්තියෙන් යුතු ව පතන්න. හදවතින් ම සාර්ථකත්වයත්, ජයග්‍රහණයත් බලාපොරොත්තු වන්න. බොහෝ දෙනා විජයග්‍රහණය, සාර්ථකත්වය, යහපත පතන්නෙ, හදවතින් ම නො ව, දියාරු ඉල්ලීම් ලෙස ය. සැක මුසු ව ය. අවිශ්වාසයේ බිඳුවක් ද හද තුළ තවරාගෙන ය. හරියාවි ද දන්නෙ නෑ. සමහර විට හරියන්නත් ඉඩ තියෙනවා, යන අඳුරු - දියාරු සංකල්පය ඔබේ මනසින් ඉවත් කර, හරියාවි, අනිවාර්යයෙන් ම හරියනවා, සාර්ථකයි, අති සාර්ථකයි යනුවෙන් වැඩේට බහින්න.

මේ ජීවිතයෙන් සාර්ථක ඵල උපරිම ව නෙළාගත යුතු නම්, බුරබුරා දැල්වුණු උද්‍යෝගයෙන් සහ කැපකිරීමකින් තමා නිමග්න වන කාර්යයේ අනලස් ව යෙදිය යුතු ය. තමා සම්බන්ධ ව සිටින රැකියාව හෝ ව්‍යාපෘතිය කුමක් හෝ වේවා, දැල්වුණු ආශාවකින්, උපරිම කැපවීමකින් එහි යෙදෙන්න. තවත් අන්දමකින් කියනවා නම් ඔබ කුමක් කළත්, එය ඔබේ ම දෙයක් ලෙස, කරන කාර්යය සහ ඔබ, දෙකක් නො ව එකක් ලෙස සලකා ක්‍රියා කරන්න. ආපසු හැරී බලන්න එපා. මුළු හදවතින් ම, මුළු ශක්තියෙන් ම යා යුතු ගමන යන්න. සිය මුළු ජීවිතය ම යම් අරමුණකට කැප කළ පුද්ගලයෙකුට ජීවිතය නැහැ බැහැ කියන්නේ නැත. අවාසනාවට බොහෝ මිනිස්සු මෙලෙස කටයුතු කරන්නේ නැත. කිහිප දෙනෙක්, ඉතා ම සුළු කොටසක් තමා කරන කාර්යය මුළු හදවතින් ම ඉටු කරති. ඔවුන්ගේ මුළු ජීවිතය ම කරනු ලබන කාර්යය හෝ දිනාගත යුතු අරමුණ කෙරෙහි තදින් බැඳී පවතී. හෙණ හතක් පහත් වුව ද, ඔවුහු නොසැලී, ඉන්ද්‍රඛීලයක් සේ නොසැලී තම අරමුණෙහි නිරත ව සිටිති. අරමුණ කවර විටෙකවත් වෙනස් නො වීම ඔවුන් හඳුනාගත හැකි ලක්ෂණයකි.

03. පහත සඳහන් වාක්‍යයන්හි ලේඛන සිංහල රීතියට අනුගත නොවන තැන් ඇත්නම් ඒවා නිවැරදිකොට නැවත ලියන්න.

i. අප අවස්ථා කිහිපයක් ගනිමු.
ii. විවිධ රටවල්වලින් එන මිනිසුන් විවිධ වැඩ සටහන්වලට සහභාගි වෙති.
iii. ප්‍රවෘති නිවේදනය අපට නොලැබිණි.
iv. තවදුරටත් ඔවුහු ප්‍රකාශ කරන්නේ ලෝකය සදාකාලික නොවන බවයි.
v. ඒ දෙදෙනා විසින් විවිධ තර්ක ඉදිරිපත් කළහ.
vi. මම පුස්ථකාලයට නිරන්තරයෙන් යමි.
vii. පරිභාහිරෙන් බැලීමේ දී මෙය තේරුම් ගැනීමට අපහසුය.
viii. ක්ෂනික ආහාර සෞඛ්‍යයට අහිතකරය.
ix. අධ්‍යයන කාර්ය්‍ය මණ්ඩලය සඳහා පුහුණු වැඩමුළුවක් පැවැත්වෙයි.
x. ළමයෙක් වෘකයෙක් සමඟ එක්ව වාසය කිරීම පුදුමයට හේතුවකි.
xi. තෙරුන්වහන්සේ විහාරයට වැඩියේය.
xii. ඇතැමෙක් බොරු කියයි.
xiii. ජලාශයෙහි සිටි මත්ස්‍යයන් අප විසින් අල්ලන ලදී.
xiv. අපි සියලු දෙනාම සත්පුරුෂයෝ විය යුතුය.
xv. අදහස් හුවමාරු කර ගැනීමට අපි විසින් භාෂාවක් භාවිත කරමු.
xvi සමහරු එසේ කීහ.
xvii පුද්ගලයෙක් තුළ විවිධ යහගුණ පවතී.
xviii විශ්ව විද්‍යාල ශිෂ්‍යයා යනු ජාතික ධනයේන් පෝෂණය ලබන දරු පරපුරකි.
xix අපි කුඩා අවදිය පටන්ම අපටම අනන්‍ය වූ භාෂාවක් කතා කරන්නෙමු.
xx ලෝකයේ එක් ජාත්‍යන්තර භාෂාවක් වන්නේ ඉංග්‍රීසියයි.

(ලකුණු 20)

04. පහත සඳහන් කොටස ලිඛිත සිංහල භාෂාවට හරවා නැවත ලියන්න.

"ඒ කල කල්කටාවේ දරුණු සාගතයක් ඇතිවුණා.. සිසුන් හැටියට අපි අතේ තිබුණේ මුදල් ටික යි. ඒ නිසා සාගත කාලය තුළ, මං සබන් ගෑම නතර කළා. කොණ්ඩය කැපීම නතර කළා. දවසකට වේලක් බැගින් නො කා ඉතිරි කර ගත් මුදලින් සමාජ සේවා කටයුතුවල යෙදුණා. මේකෙ ප්‍රතිඵලයක් විදියට ගරු සේවයක් කිරීමට මට අවස්ථාව ලැබුණා. ඒ ළමා නිවාසයෙක අධ්‍යක්ෂ තනතුරක් හෙබැවීමට යි. එය ලබා දුන්නේ අප සරසවියේ උපකුලපති ආචාර්ය ෂර්වානන්ද මහතා යි.

ඒ කල, අපිත් කෑවේ දිනකට එක වේල යි. හාල් හිඟයි. දවසක් එක් අපූරු දෙයක් සිද්ධ වුණා. එක් කාන්තාවක් ඇවිල්ලා මගෙන් කෑම ටිකක් ඉල්ලුවා. මං කිව්වා "මොකුත් නෑ, යන්න" කියලා. එතකොට ඇය මගේ මූණ බලා අනුකම්පාව ඉල්ලන විදියට මට හරියට දුක හිතුණා.

"මඳක් රැඳෙන්න" මං කීවා. කාලෙ පාන් ගෙඩි දෙකක් ඇරගෙන ආවා. ඒත් ඇයට එය කන්න බෑ. පස්සෙ පරිප්පු ගෙනැවිත් දුන්නා. ඒත් කන්න බෑ. බලන කොට ඇය ගැබ්බර කාන්තාවක්. මං මගේ බත් පිඟාන ඇයට දුන්නා. කෑමෙන් පසු තොරතුරු කතා කළා. ඇය ගංවතුරින් අනාථ වූ කාන්තාවක්. මාස එකහමාරකට පසුව තම යි, ඇය බත් කා තියෙන්නෙ.

දවසක් හැන්දෑවෙ මං දැක්කා, ඇය වැටී සිටිනවා අප හිඳින ගොඩනැගිල්ලෙ පාත මාලයේ. ඇයට උණ ගැනිලා. මං විදුහලට ගිහිල්ලා බෙහෙත් ගෙනැවිත් දුන්නා. එදා රෑ මං කාමරයට වී දිගට ම වැඩ කොට නිදා ගත්තා. රෑ දෙකට විතර ඇහැරිලා බලන කොට, මේ කාන්තාවට දරුවා ලැබිලා. උහුලන්න බැහැ. තද ශීත කාලෙ. වින්නඹුකම ඇතුළු කුඩු මහත් සියලු කටයුතු කරන්නට සිදු වුණේ මට යි. පසු ව, අපේ ප්‍රධානියාට කියා මං ඇය රෝහලට බාර දුන්නා."

(ලකුණු 20)

## Part II

05\.

**Read the paragraph and answer the following questions**

Soil is found on the upper most layer of the Earth. 1.) It is made up of a mixture of rock, minerals, plants, and some living/dead animals (mostly insects). This nutrient-rich layer of soil extends downward a few feet. This is about how far the roots of plants grow.

Some areas of the world like desert regions have very poor soil. 2.) Here, it is difficult for complex plant life to take hold. Tropical rainforests also have poor soil. Yes, the rainforest region gets enough rainfall to grow plants, but the poor soil found in rainforests is caused by so many living plants. 3.) They have the nutrients right inside themselves, so nutrients are not abundantly found in the soil.

For over a million years, the soil of the Earth has been developing. Weather has played an important role in shaping the soil. The top rocky layer of the Earth has been ground down into smaller and finer grains. Plants and animals (mostly insects) have helped to deposit nutrients.

© Sue Peterson 2012

1. Where is soil found? (2 marks)
2. What is it made up of? (2 marks)
3. Where do you find poor soil? (2 marks)
4. What plays an important role in shaping the soil? (2 marks)
5. What has helped to deposit nutrients? (2 marks)
6. For how long has the soil of the Earth been developing? (2 marks)
7. Who or what do the following words underlined in the text refer to? (6 marks)
    i.) It
    ii.) Here
    iii.) They
8. Write a suitable topic for these paragraphs (2 marks)

**i.) Develop a paragraph on the following topic sentence adhering to the basic paragraph writing rules (100 words).**

Language is a means of communication. (10 marks)

**ii.) Identify the topic sentence, supporting sentences and concluding sentence of the following paragraph. (Write the number of the sentence)**

(10 marks)

1.Slave spirituals often had hidden double meanings. 2. On one level, spirituals referenced heaven, Jesus, and the soul, but on another level, the songs spoke about slave resistance. 3. For example, according to Frederick Douglass, the song "O Canaan, Sweet Canaan" spoke of slaves' longing for heaven; but it also expressed their desire to escape to the North. 4. Careful listeners heard this second meaning in the following lyrics: "I don't expect to stay / Much longer here. / Run to Jesus, shun the danger. / I don't expect to stay." 5. When slaves sang this song, they could have been speaking of their departure from this life and their arrival in heaven; however, they also could have been describing their plans to leave the South and run, not to Jesus, but to the North. 6. Slaves even used songs like "Steal Away to Jesus (at midnight)" to announce to other slaves the time and place of secret, forbidden meetings. 7. What whites heard as merely spiritual songs, slaves discerned as detailed messages. 8. The hidden meanings in spirituals allowed slaves to sing what they could not say.

07. **Paraphrase the following paragraphs.**

(20 marks)

A fundamental part of personality that defines behavior and the way person reacts or perceives things is 'ethic'. Ethics like education always remain with you as a very significant part of your character. Ethics is a Greek word that means character or manners. But unfortunately it is collapsing in each and every sphere of life, so teaching this fundamental way of life is the need of an hour.

Unethical practices may lead to major disasters. Increasing crime forced us to think if we are left with any moral values and ethics. There is no industry that is untouched by unethical practices. So it is highly important to teach importance of ethics. Deteriorating value system laid further stress on this.

It is the responsibility of parents and teachers to impart and transmit ethical value to children and students. It is important to teach ethics at schools and even at college level to create better citizens and society. Ethical values do not allow you to act violently and unethically. Crime against women, theft, and other immoral issues in a society can easily be tackled by imparting ethical values.

https://www.mapsofindia.com/my-india/society/ethics-should-be-taught-at-schools-right-or-wrong

08. Read the following passage carefully and summarise it in about 80 wards.

(20 Marks)

Travelling by train is a lovely experience that all Sri Lankans enjoy. The dazzling views of the upcountry Main Line will leave you with splendid memories lasting a lifetime. Endorsed by many travellers as one of the best railway journeys in Asia, is the trip from Colombo to Badulla on the magnificent Udarata Menike. This 10 hour journey is filled with spectacular scenes of tea plantations, valleys and ravines. The long rail journey takes you past the nation's highest train station at Pattipola. En route the view of Batalegala (Bible Rock) are stunning. For photo enthusiasts, this rail journey is a picturesque paradise. Every innovative idea is supplemented by a genuine need. The need for railways in Ceylon was mooted not by the need to enhance public transport but by an earnest request for the transportation of coffee! Enterprising European planters had invested in their coffee plantations by 1842. Coffee was a lucrative crop in that era. The planters pressured the Governor to provide a rail line for transporting their coffee to Colombo. One of the key men behind this remarkable era of railways was B. D. Rampala, a native of Pannipitiya. Even today, his name is mentioned with reverence. Don Rampala was the Chief Mechanical Engineer of Railways and was duly promoted General Manager. In the 1950s under the Colombo Plan initiative the Canadian Government gave Ceylon her first diesel powered locomotives. Some of the engines were named Alberta, Ontario, Prince Edward Island, Montreal and Vancouver.